වාර්තාව 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 222
ආයතනයේ නම : රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා
සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ
හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 222
நிறுவனத்தின் பெயர் : பொது நிருவாக மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக
நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும்
மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Series No : 222**
**Name of the Institution : Ministry of Public Administration, Provincial Councils and Local Government**
**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 222**

නැගෙනහිර පළාත් සභාව සඳහා 2023.09.21 දින
පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
වෙත ලබාදෙන ලද නියෝග වලට අදාලව ගෙන ඇති පියවර

| කාරණාවට අදාල අංකය | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු. | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග /වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 02 | මුද්දර ගාස්තු අයකිරීම් පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය නොකිරීම | මෙ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා සියලුම පළාත් වල පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවේදී මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයේදී සම්බන්ධ වන ආයතන එකිනෙකට නිසි පරිදි සම්බන්ධ නොවන බැවින් ආදායම් රැස්කිරීමේ කාර්යයට බාධා ඇතිව ඇති බවත් අනාවරණ විය.<br><br>මේ වන විට වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන මාර්ගගත ක්‍රමවේදය භාවිතයෙන් මෙම ගැටළුව විසඳීමට හැකි බව යෝජනා කළ අතර ඒ අනුව 2024.02.06 දින පැවති අන්තර් පළාත් විෂයය සම්බන්ධීකරණ සමුළුවේදී මෙම මාර්ගගත ක්‍රමවේදය පිළිබඳව සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කරන ලදී. එම ක්‍රමවේදය එක් එක් පළාත තුළ ක්‍රියාත්මක කළ පසු මුද්දර ආදායම් නංවා ගත හැකි බව අංක PL/6/7/4/SGP හා 2024.06.30 දිනැති ලිපිය (ඇමුණුම 01) මගින් ප්‍රධාන ලේකම්වරුන්ට ද පිටපත් සහිතව රජයේ ගිණුම් පිළිබද කාරක සභාව දැනුවත් කර ඇත.මීට අමතරව PL/6/7/4/EP හා 2025.08.21 දිනැති ලිපිය මගින් මේ පිළිබඳව නැවත රජයේ ගිණුම් පිළිබද කාරක සභාව දැනුවත් කර ඇත.(ඇමුණුම 02) |
| 10 | වාහන පාලනය | පළාත් සභා 9 හි පසුගිය වසර 10 තුළ වෙන්දේසි කළ හා අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කළ වාහනවල විස්තර අංක PL/6/7/4/EP හා 2023.11.23 දිනැති ආවරණ ලිපිය (ඇමුණුම 03) මගින් සහ අදාල ලේඛනය රජයේ ගිණුම් පිළිබද කාරක සභාව වෙත යොමුකර ඇත. |

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

ඇමුණුම 01

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: PL/6/7/4/SGP | ඔබේ අංකය / உமது இல / Your No: ... | දිනය / திகதி / Date: 2024.06. 20 |

ලේකම්
රාජ්‍ය ගිණුම් කාරක සභාව

**2023.08.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග - සබරගමුව පළාත් සභාවේ 2019,2020, 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධන පරීක්ෂාව**

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ අංක PAC/09/04/2023 හා 2023.09.04 දිනැති ලිපිය හා බැදේ.

02. 2023.08.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභාව විසින් පළාත් 9 හිම ලියාපදිංචි කළ නැගි ඔප්පු ගණන හා ලියාපදිංචි කළ තෑගි ඔප්පු සඳහා අය කළ මුද්දර ගාස්තුවල නිරවද්‍යතාවය තක්සේරු කිරීමේදී අතිරේකව ගණනය කළ ගාස්තු ප්‍රමාණය නිසි පරිදි, ලබා ගෙන පළාත් තුළ ආදායම් වර්ධනය කර ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කරන ලෙසට නියෝග කර ඇත.

03. ඒ අනුව මෙ පිළිබඳව රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව හා සියළුම පළාත් වල පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවේදී මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයේදී ආයතන 05ක් (නොතාරිස් කාර්යාලය, බැංකුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, පළාත් පාලන ආයතනය, පළාත් පාලන දෙපාර්තමේන්තුව) ඊට සම්බන්ධ වන බවත් එම ආයතන එකිනෙකට සම්බන්ධ නොවන නිසා ආදායම් රැස්කිරීමේ කාර්යයට බාධා ඇතිවී ඇති බවත් සාකච්ඡා විය.

04. එසේම මේ වන විට වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මාර්ග ගත ක්‍රමවේදය භාවිතයෙන් මෙම ගැටළුව විසඳීමට හැකි බව යෝජනා විය. ඒ අනුව 2024.02.06 දින පැවති අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුවේදී මෙම මාර්ගගත ක්‍රමවේදය පිළිබඳව සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කරන ලද අතර එම ක්‍රමවේදය එක් එක් පළාත තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට දැනුම් දෙන ලදී. එම ක්‍රමවේදය පළාත තුළ ක්‍රියාත්මක කළ පසු මුද්දර ආදායම ඉහළ නංවාගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන)
ලේකම් වෙනුවට

දුරකථන : 011 2302086
ෆැක්ස් : 011 2347535
විද්‍යුත් ලිපිනය : prcouncilsb@gmail.com

පිටපත
01. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.පි. හා අ.ක.ස

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

**ඇමුණුම 02**

# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
# பொது நிருவாக, மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Administration, Provincial Councils and Local Government


| පළාත් සභා සහ පළාත් පාලන අංශය | மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரிவு | Provincial Councils and Local Government Division |
|---|---|---|
| 330, යූනියන් පෙදෙස, කොළඹ 02. | 330, யூனியன் பிளேஸ், கொழும்பு 02. | 330, Union Place, Colombo 02. |

දුරකථන / தொலைபேசி / Telephone: 011-2305326 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2329725 | ඊ-මේල් / மின்னஞ்சல் / Email: secretary@pclg.gov.lk | වෙබ් අඩවිය / இணையதளம் / Website: https://mpclg.gov.lk/


| මගේ අංකය / எனது இல / My No | PL/6/7/4/EP | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2025.08. 21 |
|---|---|---|---|---|---|

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

**<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 222 – රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව (2023.07.08 සිට 2023.10.31 දක්වා සිදු කරන ලද විමර්ශනය)</u>**
**<u>මුද්දර ගාස්තු අයකිරීම් පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය නොකිරීම</u>**

2020 වර්ෂවල විගණකාධිපති වාර්තාවලින් පැනනගින විගණන ඡේද අංක 2020 1.5.5 9 (ඇ) මගින් එකතුව රුපියල් මිලියන 349 ක මුද්දර ගාස්තු එකතු කිරීම් වසර 02ට වඩා වැඩි කාලයක සිට පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව පළාත් සභාව තුළ රඳවා ගැනීමට අදාලව පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙස නියෝගය ලබාදී ඇත.

02. සබරගමුව පළාත් සභාවට අදාලව 2024.08.24 දින පැවති ගිණුම් පිළිබඳ කාරක සභාවේදී "පළාත් 09 හිම ලියාපදිංචි කළ නැගි ඔප්පු ගණන හා ලියාපදිංචි කළ නැගි ඔප්පු සඳහා අයකළ මුද්දර ගාස්තුවල නිරවද්‍යතාවය තක්සේරු කිරීමේදී අතිරේකව ගණනය කළ ගාස්තු ප්‍රමාණය නිසි පරිදි ලබාගෙන පළාත් තුළ ආදායම් වර්ධනය කර ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සකස්කර කාරක සභාවට වාර්තා කිරීම" සඳහා ලබාදුන් නියෝගය ප්‍රකාරව 2023.11.22 දින රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරුන්ගේ සහභාගිත්වය ඇතිව සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයට සම්බන්ධවන නොතාරිස් කාර්යාලය, බැංකුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, පළාත් පාලන ආයතනය සහ පළාත් පාලන දෙපාර්තමේන්තුව යන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොමැති වීම නිසා ආදායම් රැස්කිරීමේ කාර්යයට බාධා ඇතිවී ඇති බව අනාවරණය විය.

03. ඒ අනුව වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන "මාර්ගගත ක්‍රමවේදය" භාවිතයෙන් මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයට සම්බන්ධ ප්‍රධාන ආයතන අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගෙන බැවින් **එම ක්‍රමවේදය අනෙකුත් පළාත් සඳහා ද අදාල කර ගන්නා ලෙස 2024.02.06 දින පැවති අන්තර් පළාත් විෂයය සම්බන්ධීකරණ රැස්වීමේදී පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කර ඇත.** එම සම්බන්ධව මගේ අංක PL/6/7/4/SGP හා 2024.06.30 දිනැති ලිපියෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ද දැනුවත් කර ඇත. (ඇමුණුම 01)

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා සහ පළාත් පාලන)
ලේකම් වෙනුවට

(දුරකතන : 011 2302086 / ෆැක්ස් : 011 2328282 / ඊමේල් : prcouncilsb@gmail.com)

පිටපත
01. මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව - කරු. දැ.ගැ.ස.
02. ප්‍රධාන ලේකම්, නැගෙනහිර පළාත - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 03

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: PL/6/7/4/EP
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.11. 23

ලේකම්
රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

**2023.09.21 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග**

උක්ත කරුණ සම්බන්ධව රජයේ ගිණුම් කාරක සභාවේ 2023.09.21 දින පැවති කාරක සභා රැස්වීමේ ලබාදුන් නියෝග හා බැඳේ.

02.පළාත් 09 හි වෙන්දේසි කළ හෝ අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කළ වාහන පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත් නොකිරීම නිසා එසේ ඉවත් කළ වාහනවල ලියාපදිංචිය අවලංගු නොකොට දිගටම පළාත් සභාව නමින් පවතින බැවින් පළාත් සභා 09 හි පසුගිය වසර 10 තුළ වෙන්දේසි කළ හා අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කළ වාහනවල ලේඛනයක් මෙම අමාත්‍යාංශය හරහා කාරක සභාව වෙත ලබාදීමට නියෝග කර ඇත.

03. ඒ අනුව පළාත් සභා 09 ට අදාලව පසුගිය වසර 10 තුළ වෙන්දේසි කළ හා අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කළ වාහනවල ලේඛණ මේ සමඟ කාරුණිකව ඔබ වෙත ඉදිරිපත් කරමි.

වී.චතුරානි ද සිල්වා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් සභා)
ලේකම් වෙනුවට

(දුරකතන : 011-2302086 / ෆැක්ස් : 011-2328282 /විද්‍යුත් ලිපිනය : prcouncilsb@gmail.com

පිටපත
01. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.පි.

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk